NDB bank

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

මූලික තොරතුරු ලේඛනය

- පොදු මූලික කරුණු
- ආචාර ඉතුරුම් ගිණුම
- ආචාර ජංගම ගිණුම
- ආචාර ස්ථාවර තැන්පතු ගිණුම
- බිග් සේවර් ප්ලස් ගිණුම
- ඊසි සේවර් ඉතුරුම් ගිණුම
- මනී මාර්කට් ඉතුරුම් ගිණුම
- NDB අරලිය ඉතුරුම් ගිණුම
- NDB රේමිට් සේවර් ගිණුම
- NDB ජංගම ගිණුම
- NDB ස්ථාවර තැන්පතු ගිණුම
- NDB මයිනර් සේවින්ස් ප්ලෑනර් ගිණුම
- NDB සේවින්ස් ප්ලෑනර් ගිණුම
- NDB රිවර්ස් ප්ලෑනර් ගිණුම
- NDB ශිල්ප ළමා ඉතුරුම් ගිණුම
- පික්සල් ඩිජිටල් ළමා ඉතුරුම් ගිණුම
- ප්‍රිවිලේජ් ජූනියර් ළමා ඉතුරුම් ගිණුම
- රියල් සේවර් ගිණුම (RSA)
- සැලරි මැක්ස් ජංගම ගිණුම
- සැලරි මැක්ස් ඉතුරුම් ගිණුම
- සැලරි මැක්ස් අයිරා/ ණය පහසුකම
- විශ්මිත ඉතුරුම් ගිණුම

වර්ගීකරණය : පොදු

පොදු මූලික කරුණු

තැන්පතු රක්ෂණ ආවරණය

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (NDB බැංකුව) ආයතනය වෙත නිකුත්කර ඇති බැංකු බලපත්‍රය ශ්‍රී ලංකා මහබැංකුව විසින් (CBSL) අවලංගු කලහොත් කලින් කල ශ්‍රී ලංකා මහබැංකුව (CBSL) විසින් නිශ්චය කරනු ලබන උපරිම මුදලක් දක්වා, යෝග්‍ය තැන්පතුකරුවන් සඳහා වන්දි පූරණය කිරීමේ අරමුණින් යුතුව ශ්‍රී ලංකා මහබැංකුව (CBSL) විසින්, නිකුත් කරනු ලබන දැනට බලපවත්නා විධාන සහ නියෝග ප්‍රකාරව, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ සියලු යෝග්‍ය තැන්පත්කරුවන් රක්ෂණය කරනු ලැබේ.

ක්‍රියාත්මක නොවන, අක්‍රීය වූ ගිණුම් සහ අත්හැර දමන ලද දේපළ

(i) මාස දොළහක (12) අඛණ්ඩ කාලසීමාවක් සඳහා ගනුදෙනුකරු විසින් ගනුදෙනු කටයුතු සිදුකර නොමැති, විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් ද ඇතුලු, යම් ජංගම හෝ ඉතුරුම් ගිණුමක් "ක්‍රියාත්මක නොවන ගිණුමක්" ("Inactive account") ලෙස NDB බැංකුව විසින් වර්ගීකරණය කරනු ලැබේ; තව ද

(ii) මාස විසිහතරක (24) අඛණ්ඩ කාලසීමාවක් සඳහා ගනුදෙනුකරු විසින් ගනුදෙනු කටයුතු සිදුකර නොමැති, විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්ද ඇතුලු, යම් ජංගම හෝ ඉතුරුම් ගිණුමක් "අක්‍රීය වූ ගිණුමක්" ("Dormant account") ලෙස NDB බැංකුව විසින් වර්ගීකරණය කරනු ලැබේ.

"එසේ ක්‍රියාත්මක නොවන" / "අක්‍රීය" ගිණුමක් වශයෙන් බැංකුව විසින් වර්ගීකරණය කරන ලද යම් ගිණුමක් ක්‍රියාත්මක කිරීම සඳහා ගිණුම්හිමියා විසින් ස්වකීය බැංකු ශාඛා කළමනාකරු හෝ සම්බන්ධතා කළමනාකරු හමුවී ලිඛිත ඉල්ලීමක් භාරදෙනු ලැබිය යුතු ය.

ගනුදෙනුකරු විසින් වසර දහයක (10) කාලසීමාවක් සඳහා කිසිදු ක්‍රියාකාරකමක් සිදුකර නොමැති බවට වාර්තා වී ඇති ගිණුම්, 1988 අංක. 30 දරන බැංකු පනත යටතේ, අත්හැරදමන ලද දේපළ වශයෙන් විස්තර කරනු ලබන අතර එවැනි ගිණුම් ඒ අනුව කලින්කල ශ්‍රී ලංකා මහබැංකුව විසින් නිකුත්කරනු ලබන විධාන ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) වෙත පවරනු ලැබේ.

CBSL වෙත පවරා ඇති එවැනි අත්හැර දමන ලද දේපළ සඳහා හිමිකම් ඉදිරිපත් කිරීමට ගිණුම්හිමියා විසින් අපේක්ෂා කරනු ලබන අවස්ථාවක දී, ඔහු/ඇය විසින් ස්වකීය බැංකු ශාඛා කළමනාකරු හෝ සම්බන්ධතා කළමනාකරු හමුවී බැංකුවේ ප්‍රමිතිගත ආකෘතියෙන් (ඕනෑම බැංකු ශාඛාවක පවතින) ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය.

පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ කාර්යපටිපාටිය

බැංකුවේ ආසන්නතම ශාඛාව වෙත හෝ බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානය වෙත හෝ ප්‍රධාන කාර්යාලය වෙත, බැංකුවේ නිල වෙබ් අඩවිය හරහා හෝ බැංකුවේ යම් නිල ප්‍රකාශයක් හෝ නිවේදනයක් හරහා දැනුම් දී ඇති කාර්ය පටිපාටියට අනුව, බැංකුව වෙත වාචිකව හෝ ලිඛිතව ඕනෑම පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම සඳහා ගිණුම්හිමියාට අයිතියක් ඇත්තේ ය. එවැනි යම් පැමිණිල්ල විසඳා නොමැති අවස්ථාවක දී, ගිණුම් හිමියා විසින් මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයා හරහා එම ගැටලුව සඳහා පිළිසරණක් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය. (මෙම ලේඛනයේ අවසාන පිටුවේ සඳහන් විස්තරවලට අනුව)

NDB සේවින්ස් ප්ලෑනර් ගිණුම/ මයිනර් සේවින්ස් ප්ලෑනර් ගිණුම ආශ්‍රිත මූලික අවදානම්

ගිණුම් හිමියා විසින් මාසික වාරික මුදල් ගෙවනු නොලබන සහ/හෝ ගෙවීම අඛණ්ඩව සිදුනොකරන අවස්ථාවක දී, සේවින්ස් ප්ලෑනර් ගිණුම/ මයිනර් සේවින්ස් ප්ලෑනර් ගිණුම සඳහා අදාලවන පොළී අනුපාතිකය බැංකුවේ පරම අභිමතය පරිදි තීරණය කරනු ලැබේ.

පුද්ගලික තොරතුරු ආරක්ෂා කිරීම

ගනුදෙනුකරුගේ මූල්‍ය වත්කම් ආරක්ෂා කිරීමේදී මෙම තොරතුරු ඉතාමත් තීරණාත්මකවන බැවින්, කිසිදු අවස්ථාවක ගනුදෙනුකරු විසින් මුරවචන (Passwords), රහස් අංක (PIN අංක) හා OTP යනාදි සංවේදී තොරතුරු වෙනත් කෙනෙකුට ලබා දීමෙන් වැළකී සිටිය යුතුවේ. වෙනත් ඕනෑම පාර්ශවයකට මෙම සංවේදී තොරතුරු ලබාගැනීමට හැකි පරිදි රහස් අංක (PIN අංක) සහ මුරවචන පිළිබඳ කිසිදු ආකාරයකින් කිසිදු ලිඛිත වාර්තාවක් ගනුදෙනුකරු විසින් පවත්වාගෙන නොයා යුතුවේ. PIN අංක, මුරවචන සහ OTP වෙනත් තැනැත්තකුට පවරනු නොලැබිය යුතු මෙන්ම ඒවා අදාල ගනුදෙනුකරුගේ භාවිතයට පමණක් සීමා විය යුතු ය. එවැනි සංවේදී තොරතුරු දැඩි රහස්‍ය භාවයෙන් පවත්වාගෙන යෑම ගනුදෙනුකරුගේ සම්පූර්ණ වගකීම වේ.

ගිණුම වෙත ප්‍රවේශවීම පාලනය කිරීම

අනවසර ගනුදෙනු සිදුවන අවස්ථාවක දී ගනුදෙනුකරුවන් ඒ සම්බන්ධයෙන් වගකීමට යටත්වන බැවින් සහ ඒ සම්බන්ධයෙන් නීතිය බලාත්මක කිරීමේ නියෝජිත ආයතන සමග සහයෝගීව ක්‍රියාකිරීමට සිදුවන බැවින්, ගනුදෙනුකරුවන් විසින් ස්වකීය ගිණුම් ක්‍රියාත්මක කිරීම සඳහා තුන්වන පාර්ශ්ව වෙත අවසර ලබා නොදිය යුතු ය.

ගිණුම් විවෘත කිරීම සහ වසාදැමීම මෙන්ම ඒ හා සම්බන්ධ ගාස්තු

සියලු ලේඛනමය අවශ්‍යතා සහ බැංකුව විසින් පෙන්වා දෙනු ලබන වෙනත් අවශ්‍යතා සපුරාලීමට යටත්ව ගණුදෙනුකරුගේ කැමැත්ත පරිදි ගිණුම/ ගිණුම් විවෘතකරන ලෙස බැංකුවෙන් ඉල්ලා සිටීමේ අවස්ථාව ගනුදෙනුකරුවන් සතුවේ. එසේ වුව ද, එවැනි අවශ්‍යතා බැංකුව සෑහීමට පත්වන ආකාරයට සපුරාලනු නොලබන අවස්ථාවක දී, බැංකුව විසින් එවැනි ඉල්ලීම් ස්වකීය අභිමතය පරිදි නිශ්ප්‍රභ කරනු ලැබිය හැකිවේ.

බැංකුව වෙත පූර්ව ලිඛිත නිවේදනයක් ලබාදීමෙන් පසුව ස්වකීය ඕනෑම ගිණුමක් වසා දැමීමේ අයිතිය ගනුදෙනුකරුවන් සතුවේ. එසේ වුව ද, ගිණුම් වසාදැමීම හා ආශ්‍රිතව අදාල විය හැකි බැංකු ගාස්තු පැවතිය හැකි බවට සැලකිය යුතු වේ.

බැංකුව විසින් ස්වකීය අවශ්‍යතාවය අනුව හෝ යම් අධිකරණයක හෝ නියාමන හෝ පරිපාලන නියෝගයක අවශ්‍යතාවය අනුව යම් ගිණුමක ගනුදෙනු කටයුතු වසාදැමීමේ, තහනමකට ගැනීමේ හෝ අත්හිටුවීමේ අයිතිය මෙන්ම මාස විසිහතරක් (24) හෝ වැඩි කාලසීමාවකට ක්‍රියාත්මක නොවන/ අක්‍රීය වූ ගිණුම්, වසාදැමීමේ අයිතිය සහ/හෝ බැංකුව විසින් කලින්කල තීරණය කරනු ලබන අවම ශේෂය පවත්වාගෙන යෑම සිදුනොකරන අවස්ථාවක දී ගනුදෙනුකරු වෙත පූර්ව ලිඛිත දැනුම්දීමක් කිරීමෙන් පසුව එවැනි ගිණුම් වසාදැමීමේ අයිතිය ද බැංකුව වෙත තබාගනු ලැබේ.

බදු සහ ගාස්තු

WHT, ආදායම් බදු, මූල්‍ය සේවා, වැට්බදු යනාදිය ඇතුලු සියලු බලපවත්වන්නා බදු හෝ ගාස්තු බලපවත්නා බදු සහ වෙනත් අදාල නියෝගවලට අනුකූලව අයකරනු ලැබේ. පනවා ඇති හෝ වෙනත් යම් බලධරයකු (බලධරයන්) විසින් පනවනු ලැබිය හැකි FATCA හෝ වෙනත් යම් නියෝගයක්/ නියෝගවල සඳහන් විධිවිධාන මගින් නියමකර ඇති දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව හෝ වෙනත් යම් නියාමන අධිකාරියක්/ අධිකාරීන් වෙත ගෙවිය යුතු අදාල බදු සහ/හෝ ගාස්තු ප්‍රේෂණය කිරීම සඳහා බැංකුව වෙත බලය පවරා ඇත.

මූලික තොරතුරු ලේඛනය - ආචාර ඉතුරුම් ගිණුම

නිෂ්පාදනය/ සේවය	දිරිගැන්වීම් සහ ප්‍රවර්ධන ඇතුලු මූල්‍යමය සහ වෙනත් ප්‍රතිලාභ	ගාස්තු/ අයකිරීම් කොමිස් මුදල්, පොළිය	නිෂ්පාදනය/ සේවය ලබා ගැනීම සඳහා අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය	ප්‍රධාන නියම හා කොන්දේසි
ආචාර ඉතුරුම් ගිණුම	• දෛනික ශේෂය මත පොළිය ගණනයකර මාසිකව ගිණුමට බැරකිරීම • NEOS ජංගම බැංකු සේවය සහ මාර්ගගත බැංකු සේවා පහසුකම මෙන්ම විද්‍යුත් ප්‍රකාශ පහසුකම සඳහා සුදුසුකම් ලැබීම • නිත්‍ය නියෝග පහසුකම සඳහා සුදුසුකම් ලැබීම • ස්වීප් ඉන්/ ස්වීප් අවුට් පහසුකම් සඳහා සුදුසුකම් ලැබීම • දිවයින පුරා පවතින ශාඛා ජාලය හරහා පහසුවෙන් මුදල් තැන්පත්කිරීම/ මුදල් ආපසු ගැනීම/ ගිණුම් අතර මුදල් හුවමාරු කිරීම සහ තෝරාගත් ශාඛාවලදී දීර්ඝකරන ලද කාලසීමාවල දී බැංකු පහසුකම් ලබා ගැනීමේ පහසුකම. • වීසා (Visa) සේවා පහසුකම් සහිත ඩෙබිට් කාඩ්පත හරහා ලෝකයේ ඕනෑම තැනක	සවිස්තරාත්මක සහ අලුත්ම ගාස්තු මෙන්ම අවම ශේෂ අවශ්‍යතා දැනගැනීම සඳහා කරුණාකර NDB වෙබ් අඩවියේ පවතින ගාස්තු අත්පොත කියවා බලන්න. අලුත්ම පොළී අනුපාතිකය සහ වාර්ෂික සඵල පොළී අනුපාතිකය (AER) පිළිබඳව දැනගැනීම සඳහා කරුණාකර, NDB බැංකු වෙබ්	• මැන්ඩේට් පත්‍රය සම්පූර්ණ කිරීම. • KYC අවශ්‍යතාවය • වලංගු ජාතික හැඳුනුම්පතෙහි (NIC) පිටපතක් සහ ජාතික හැඳුනුම්පත නොමැති නම්, ජා.හැ.පත් අංකය සඳහන්වන රියදුරු බලපත්‍රය/ විදේශ ගමන් බලපත්‍රය. • ලිපිනය සනාථ කිරීමක් (අවශ්‍ය වේනම්) • විශ්‍රාම වැටුප් හැඳුනුම්පත්‍රයේ පිටපතක් (අනිවාර්ය නොවේ)	• වයස අවුරුදු 55 ක් වන සහ ඊට වැඩි ශ්‍රී ලංකාවේ නේවාසික පුරවැසියන් හෝ ශ්‍රී ලංකාවේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් මාසික විශ්‍රාම වැටුප් ලබන පුද්ගලයන්. • විශ්‍රාමිකයන් සඳහා හවුල් ගිණුම් විවෘත කිරීමට අවසර නොලැබෙන අතර විශ්‍රාමිකයන් නොවන ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විසින් විශ්‍රාමිකයන් නොවන ජ්‍යෙෂ්ඨ පුරවැසියකු සමග පමණක් හවුල් ගිණුම් විවෘත කිරීම සඳහා අවසර දෙනු ලැබේ.

	සිට පැය 24 පුරා ඔබගේ ගිණුම වෙත ප්‍රවේශ වීමේ හැකියාව.	අඩවිය වෙත පිවිසෙන්න		• ගිණුම් විවෘත කිරීමේ ආරම්භක තැන්පතු මුදල ශ්‍රී.ල.රු. 2,500 ක් වේ.

මූලික තොරතුරු ලේඛනය - ආචාර ජංගම ගිණුම

නිෂ්පාදනය/ සේවය	දිරිගැන්වීම් සහ ප්‍රවර්ධන ඇතුලු මූල්‍යමය සහ වෙනත් ප්‍රතිලාභ	ගාස්තු/ අයකිරීම් කොමිස් මුදල්, පොළිය	නිෂ්පාදනය/ සේවය ලබා ගැනීම සඳහා අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය	ප්‍රධාන නියම හා කොන්දේසි
ආචාර ජංගම	• චෙක්පොත් පහසුකම සඳහා සුදුසුකම් ලැබීම • NEOS ජංගම බැංකු සේවය සහ මාර්ගගත බැංකු සේවා පහසුකම මෙන්ම විද්‍යුත් ප්‍රකාශ පහසුකම සඳහා සුදුසුකම් ලැබීම • නිත්‍ය නියෝග පහසුකම සඳහා සුදුසුකම් ලැබීම • ස්වීප් ඉන්/ ස්වීප් අවුට් පහසුකම් සඳහා සුදුසුකම් ලැබීම	සවිස්තරාත්මක සහ අලුත්ම ගාස්තු මෙන්ම අවම ශේෂ අවශ්‍යතා දැනගැනීම සඳහා කරුණාකර NDB වෙබ් අඩවියේ පවතින ගාස්තු අත්පොත කියවා බලන්න.	• ශාඛා කළමනාකරු විසින් පවත්වන පුද්ගලික සම්මුඛ පරීක්ෂණය • මැන්ඩේට් පත්‍රය සම්පූර්ණ කිරීම. • KYC අවශ්‍යතාවය • වලංගු ජාතික හැඳුනුම්පතෙහි (NIC) පිටපතක් සහ ජාතික හැඳුනුම්පත නොමැති	• වයස අවුරුදු 55 ක් වන සහ ඊට වැඩි ශ්‍රී ලංකාවේ නේවාසික පුරවැසියන් හෝ ශ්‍රී ලංකාවේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් මාසික විශ්‍රාම වැටුප් ලබන පුද්ගලයන්. • විශ්‍රාමිකයන් සඳහා හවුල් ගිණුම් විවෘත කිරීමට අවසර නොලැබෙන අතර විශ්‍රාමිකයන් නොවන ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විසින් විශ්‍රාමිකයන් නොවන ජ්‍යෙෂ්ඨ පුරවැසියකු සමග

	• දිවයින පුරා පවතින ශාඛා ජාලය හරහා පහසුවෙන් මුදල් තැන්පත්කිරීම/ මුදල් ආපසු ගැනීම/ ගිණුම් අතර මුදල් හුවමාරු කිරීම සහ තෝරාගත් ශාඛාවලදී දීර්ඝකරන ලද කාලසීමාවල දී බැංකු පහසුකම් ලබා ගැනීමේ පහසුකම. • වීසා (Visa) සේවා පහසුකම් සහිත ඩෙබිට් කාඩ්පත හරහා ලෝකයේ ඕනෑම තැනක සිට පැය 24 පුරා ඔබගේ ගිණුම වෙත ප්‍රවේශ වීමේ හැකියාව.		නම්, ජා.හැ.පත් අංකය සඳහන්වන රියදුරු බලපත්‍රය/ විදේශ ගමන් බලපත්‍රය. • ලිපිනය සනාථ කිරීමක් (අවශ්‍ය වේනම්) • විශ්‍රාම වැටුප් හැඳුනුම්පත්‍රයේ පිටපතක් (අනිවාර්ය නොවේ)	පමණක් හවුල් ගිණුම් විවෘත කිරීම සඳහා අවසර දෙනු ලැබේ. • ගිණුම් විවෘත කිරීමේ ආරම්භක තැන්පතු මුදල ශ්‍රී.ල.රු. 5,000 ක් වේ. • මාසික අවම ගිණුම් ශේෂය ශ්‍රී.ල.රු. 5,000 ක් වේ.

මූලික තොරතුරු ලේඛනය - ආචාර ස්ථාවර තැන්පතු ගිණුම

නිෂ්පාදනය/ සේවය	දිරිගැන්වීම් සහ ප්‍රවර්ධන ඇතුලු මූල්‍යමය සහ වෙනත් ප්‍රතිලාභ	ගාස්තු/ අයකිරීම් කොමිස් මුදල්, පොළිය	නිෂ්පාදනය/ සේවය ලබා ගැනීම සඳහා අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය	ප්‍රධාන නියම හා කොන්දේසි
ආචාර ස්ථාවර ඉතුරුම් ගිණුම	• ඕනෑම කාලසීමාවක් සඳහා බැංකුවේ සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකයට වඩා 0.25% ක වැඩි ප්‍රමාණයක්	• අලුත්ම පොළී අනුපාතික සහ වාර්ෂික සඵල පොළී අනුපාතිකය (AER) පිළිබඳව දැනගැනීම සඳහා කරුණාකර, NDB	• මැන්ඩේට් පත්‍රය සම්පූර්ණ කිරීම. • KYC අවශ්‍යතාවය • වලංගු ජාතික හැඳුනුම්පතෙහි (NIC) පිටපතක් සහ ජාතික හැඳුනුම්පත නොමැති නම්, ජා.හැ.පත් අංකය සඳහන්වන	• වයස අවුරුදු 55 ක් වන සහ ඊට වැඩි ශ්‍රී ලංකාවේ නේවාසික පුරවැසියන්. • වයස අවුරුදු 55 ක් වන සහ ඊට වැඩි

		බැංකු වෙබ් අඩවිය වෙත පිවිසෙන්න. • කල්පිරීමට පෙරාතුව මුදල් ආපසු ලබාගැනීම් බැංකුව විසින් තීරණය කරනු ලබන යම් දඩ මුදල් සහ ගාස්තු අයකිරීම්වලට යටත් වන්නේය.	රියදුරු බලපත්‍රය/ විදේශ ගමන් බලපත්‍රය. • ලිපිනය සනාථ කිරීමක් (අවශ්‍ය වේනම්) • විශ්‍රාම වැටුප් හැඳුනුම්පත්‍රයේ පිටපතක් (අනිවාර්ය නොවේ)	තවත් ජ්‍යෙෂ්ඨ පුරවැසියකු සමග ගිණුම් විවෘත කිරීමට අවසර දෙනු ලැබේ.

මූලික තොරතුරු ලේඛනය - බිග් සේවර් ප්ලස් ගිණුම

නිෂ්පාදනය/ සේවය	දිරිගැන්වීම් සහ ප්‍රවර්ධන ඇතුලු මූල්‍යමය සහ වෙනත් ප්‍රතිලාභ	ගාස්තු/ අයකිරීම් කොමිස් මුදල්, පොළිය	නිෂ්පාදනය/ සේවය ලබා ගැනීම සඳහා අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය	ප්‍රධාන නියම හා කොන්දේසි
බිග් සේවර් ප්ලස් ගිණුම	• දෛනික ශේෂය මත පොළිය ගණනයකර මාසිකව ගිණුමට බැරකිරීම • NEOS ජංගම බැංකු සේවය සහ මාර්ගගත බැංකු සේවා පහසුකම මෙන්ම විද්‍යුත් ප්‍රකාශ පහසුකම සඳහා සුදුසුකම් ලැබීම	සවිස්තරාත්මක සහ අලුත්ම ගාස්තු මෙන්ම අවම ශේෂ අවශ්‍යතා දැනගැනීම සඳහා කරුණාකර NDB වෙබ්	• මැන්ඩේට් පත්‍රය සම්පූර්ණ කිරීම. • KYC අවශ්‍යතාවය • වලංගු ජාතික හැඳුනුම්පතෙහි (NIC)	• වයස අවුරුදු 18 ට වඩා වැඩි ශ්‍රී ලංකාවේ නේවාසික පුරවැසියන්

	• නිත්‍ය නියෝග පහසුකම සඳහා සුදුසුකම් ලැබීම • ස්වීප් ඉන්/ ස්වීප් අවුට් පහසුකම් සඳහා සුදුසුකම් ලැබීම • දිවයින පුරා පවතින ශාඛා ජාලය හරහා පහසුවෙන් මුදල් තැන්පත්කිරීම/ මුදල් ආපසු ගැනීම/ ගිණුම් අතර මුදල් හුවමාරු කිරීම සහ තෝරාගත් ශාඛාවලදී දීර්ඝකරන ලද කාලසීමාවල දී බැංකු පහසුකම් ලබා ගැනීමේ පහසුකම. • වීසා (Visa) සේවා පහසුකම් සහිත ඩෙබිට් කාඩ්පත හරහා ලෝකයේ ඕනෑම තැනක සිට පැය 24 පුරා ඔබගේ ගිණුම වෙත ප්‍රවේශ වීමේ හැකියාව.	අඩවියේ පවතින ගාස්තු අත්පොත කියවා බලන්න. අලුත්ම පොළී අනුපාතිකය සහ වාර්ෂික සඵල පොළී අනුපාතිකය (AER) පිළිබඳව දැනගැනීම සඳහා කරුණාකර, NDB බැංකු වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.	පිටපතක් සහ ජාතික හැඳුනුම්පත නොමැති නම්, ජා.හැ.පත් අංකය සඳහන්වන රියදුරු බලපත්‍රය/ විදේශ ගමන් බලපත්‍රය. • ලිපිනය සනාථ කිරීමක් (අවශ්‍ය වේනම්)	• ගිණුම් විවෘත කිරීමේ ආරම්භක තැන්පතු මුදල ශ්‍රී.ල.රු. 50,000 ක් වන අතර මාසික අවම ශේෂ අවශ්‍යතාවය ශ්‍රී.ල.රු. 1,000 ක් වේ.

මූලික තොරතුරු ලේඛනය - ඊසි සේවර් ඉතුරුම් ගිණුම

නිෂ්පාදනය/ සේවය	දිරිගැන්වීම් සහ ප්‍රවර්ධන ඇතුලු මූල්‍යමය සහ වෙනත් ප්‍රතිලාභ	ගාස්තු/ අයකිරීම් කොමිස් මුදල්, පොළිය	නිෂ්පාදනය/ සේවය ලබා ගැනීම සඳහා අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය	ප්‍රධාන නියම හා කොන්දේසි
ඊසි සේවර් ඉතුරුම් ගිණුම	• දෛනික ශේෂය මත පොළිය ගණනයකර මාසිකව ගිණුමට බැරකිරීම	සවිස්තරාත්මක සහ අලුත්ම ගාස්තු මෙන්ම අවම ශේෂ අවශ්‍යතා	• මැන්ඩේට් පත්‍රය සම්පූර්ණ කිරීම. • KYC අවශ්‍යතාවය	• වයස අවුරුදු 18 ට වඩා වැඩි ශ්‍රී

	• NEOS ජංගම බැංකු සේවය සහ මාර්ගගත බැංකු සේවා පහසුකම මෙන්ම විද්‍යුත් ප්‍රකාශ පහසුකම සඳහා සුදුසුකම් ලැබීම • නිත්‍ය නියෝග පහසුකම සඳහා සුදුසුකම් ලැබීම • ස්වීප් ඉන්/ ස්වීප් අවුට් පහසුකම් සඳහා සුදුසුකම් ලැබීම • දිවයින පුරා පවතින ශාඛා ජාලය හරහා පහසුවෙන් මුදල් තැන්පත්කිරීම/ මුදල් ආපසු ගැනීම/ ගිණුම් අතර මුදල් හුවමාරු කිරීම සහ තෝරාගත් ශාඛාවලදී දීර්ඝකරන ලද කාලසීමාවල දී බැංකු පහසුකම් ලබා ගැනීමේ පහසුකම. • වීසා (Visa) සේවා පහසුකම් සහිත ඩෙබිට් කාඩ්පත හරහා ලෝකයේ ඕනෑම තැනක සිට පැය 24 පුරා ඔබගේ ගිණුම වෙත ප්‍රවේශ වීමේ හැකියාව.	දැනගැනීම සඳහා කරුණාකර NDB වෙබ් අඩවියේ පවතින ගාස්තු අත්පොත කියවා බලන්න. අලුත්ම පොළී අනුපාතිකය සහ වාර්ෂික සඵල පොළී අනුපාතිකය (AER) පිළිබඳව දැනගැනීම සඳහා කරුණාකර, NDB බැංකු වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.	• වලංගු ජාතික හැඳුනුම්පතෙහි (NIC) පිටපතක් සහ ජාතික හැඳුනුම්පත නොමැති නම්, ජා.හැ.පත් අංකය සඳහන්වන රියදුරු බලපත්‍රය/ විදේශ ගමන් බලපත්‍රය. • ලිපිනය සනාථ කිරීමක් (අවශ්‍ය වේනම්)	ලංකාවේ නේවාසික පුරවැසියන් • ගිණුම් විවෘත කිරීමේ ආරම්භක තැන්පතු මුදල ශ්‍රී.ල.රු. 5,000 ක් වේ. • අවම මාසික ශේෂ අවශ්‍යතාව ශ්‍රී.ල.රු. 2,500 ක් වේ.

මූලික තොරතුරු ලේඛනය - මනී මාර්කට් ඉතුරුම් ගිණුම

නිෂ්පාදනය/ සේවය	දිරිගැන්වීම් සහ ප්‍රවර්ධන ඇතුලු මූල්‍යමය සහ වෙනත් ප්‍රතිලාභ	ගාස්තු/ අයකිරීම් කොමිස් මුදල්, පොළිය	නිෂ්පාදනය/ සේවය ලබා ගැනීම සඳහා අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය	ප්‍රධාන නියම හා කොන්දේසි
මනී මාර්කට් ඉතුරුම් ගිණුම	• පොළී අනුපාතිකය අන්තර්-බැංකු ඇමතුම් මුදල් වෙළඳපල අනුපාතිකය මත පදනම් වීම සහ සතිපතා ගැලපීම • NEOS ජංගම බැංකු සේවය සහ මාර්ගගත බැංකු සේවා පහසුකම මෙන්ම විද්‍යුත් ප්‍රකාශ පහසුකම සඳහා සුදුසුකම් ලැබීම • නිත්‍ය නියෝග පහසුකම සඳහා සුදුසුකම් ලැබීම • අවම සාමාන්‍ය මාසික ශේෂය පවත්වගෙන යෑමට යටත්ව ස්වීප් ඉන්/ ස්වීප් අවුට් පහසුකම් සඳහා සුදුසුකම් ලැබීම සහ එසේ එම අවශ්‍යතාවය සපුරාලනු නොලැබුවහොත්	සවිස්තරාත්මක සහ අලුත්ම ගාස්තු මෙන්ම අවම ශේෂ අවශ්‍යතා දැනගැනීම සඳහා කරුණාකර NDB වෙබ් අඩවියේ පවතින ගාස්තු අත්පොත කියවා බලන්න. අලුත්ම පොළී අනුපාතිකය සහ වාර්ෂික සඵල පොළී අනුපාතිකය	• වැඩි විස්තර සඳහා කරුණාකර NDB ඇමතුම් මධ්‍යස්ථානය හා සම්බන්ධ වන්න; නැතහොත් ළඟම පිහිටි	• වයස අවුරුදු 18 ට වැඩි ශ්‍රී ලංකාවේ නේවාසික පුරවැසියන් • ගිණුම් විවෘත කිරීමේ ආරම්භක තැන්පතු මුදල ශ්‍රී.ල.රු. 1,000,000 ක් වේ. • අවම මාසික සාමාන්‍ය ශේෂ අවශ්‍යතාවය

	ගාස්තු අත්පොතෙහි සඳහන් අවම ශේෂ ගාස්තුව සඳහා ගිණුම යටත් වේ • දිවයින පුරා පවතින ශාඛා ජාලය හරහා පහසුවෙන් මුදල් තැන්පත්කිරීම/ මුදල් ආපසු ගැනීම/ ගිණුම් අතර මුදල් හුවමාරු කිරීම සහ තෝරාගත් ශාඛාවලදී දීර්ඝකරන ලද කාලසීමාවල දී බැංකු පහසුකම් ලබා ගැනීමේ පහසුකම. • වීසා (Visa) සේවා පහසුකම් සහිත ඩෙබිට් කාඩ්පත හරහා ලෝකයේ ඕනෑම තැනක සිට පැය 24 පුරා ඔබගේ ගිණුම වෙත ප්‍රවේශ වීමේ හැකියාව.	(AER) පිළිබඳව දැනගැනීම සඳහා කරුණාකර, NDB බැංකු වෙබ් අඩවි වෙත පිවිසෙන්න. පොළී අනුපාතිකය මාසිකව සමාලෝචනය කරනු ලැබේ.	ශාඛාව වෙත පියනගන්න	ශ්‍රී.ල.රු. 1,000,000/- ක් වන අතර එය සපුරාලනු නොලැබුවහොත් ගාස්තු අත්පොතෙහි සඳහන් අවම ශේෂ ගාස්තුවකට ගිණුම යටත්වනු ඇත.

මූලික තොරතුරු ලේඛනය - NDB අරලිය ඉතුරුම් ගිණුම (වනිතා ඉතුරුම් ගිණුම)

නිෂ්පාදනය/ සේවය	දිරිගැන්වීම් සහ ප්‍රවර්ධන ඇතුලු මූල්‍යමය සහ වෙනත් ප්‍රතිලාභ	ගාස්තු/ අයකිරීම් කොමිස් මුදල්, පොළිය	නිෂ්පාදනය/ සේවය ලබා ගැනීම සඳහා අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය	ප්‍රධාන නියම හා කොන්දේසි

අරලිය ඉතුරුම් ගිණුම	• දෛනික ශේෂය මත පොළිය ගණනයකර මාසිකව ගිණුමට බැරකිරීම • ශ්‍රී.ල.රු. 10,000/- ක මාසික සාමාන්‍ය ශේෂයක් පවත්වාගෙන යන ගිණුම් සඳහා ගිණුම්හිමියාගේ දරු උපතකදී බැංකුව විසින් ලබාදෙන ආරම්භක තැන්පතුවක්ද සමගින් නොමිලේ බාලවයස්කාර ගිණුමක් පිරිනැමීම • පවුලේ සාමාජිකයන් වෙනුවෙන් නොමිලේ වෛද්‍ය සහ ජීවිත රක්ෂණයක් ලබාදීම. එම රක්ෂණ ඔප්පුව සහ ඒ සම්බන්ධ ප්‍රතිලාභ ගෙවීම් රක්ෂිතයාගේ අදාල රක්ෂණ ඔප්පුව යටතේ විධිවිධාන සලස්වා ඇති සියලු නියම, කොන්දේසි, සීමාකිරීම් සහ බැහැරකිරීම්වලට යටත් වන්නේ ය • 21 වන උපන්දිනයේ දී තෑගි වවුචරයක් ලබාදීම • ගිණුම්හිමියා සඳහා නවීන ATM සහ ඩෙබිට් කාඩ්පත් ලබාදීම • NEOS ජංගම බැංකු සේවය සහ මාර්ගගත බැංකු සේවා පහසුකම මෙන්ම විද්‍යුත් ප්‍රකාශ පහසුකම සඳහා සුදුසුකම් ලැබීම • නිත්‍ය නියෝග පහසුකම සඳහා සුදුසුකම් ලැබීම • ස්වීප් ඉන්/ ස්වීප් අවුට් පහසුකම් සඳහා සුදුසුකම් ලැබීම • දිවයින පුරා පවතින ශාඛා ජාලය හරහා පහසුවෙන් මුදල් තැන්පත්කිරීම/ මුදල් ආපසු ගැනීම/ ගිණුම් අතර මුදල් හුවමාරු කිරීම සහ තෝරාගත් ශාඛාවලදී දීර්ඝකරන ලද කාලසීමාවල දී බැංකු පහසුකම් ලබා ගැනීමේ පහසුකම. • වීසා (Visa) සේවා පහසුකම් සහිත ඩෙබිට් කාඩ්පත හරහා ලෝකයේ ඕනෑම තැනක සිට පැය 24 පුරා ඔබගේ ගිණුම වෙත ප්‍රවේශ වීමේ හැකියාව	සවිස්තරාත්මක සහ අලුත්ම ගාස්තු මෙන්ම අවම ශේෂ අවශ්‍යතා දැනගැනීම සඳහා කරුණාකර NDB වෙබ් අඩවියේ පවතින ගාස්තු අත්පොත කියවා බලන්න. අලුත්ම පොළී අනුපාතිකය සහ වාර්ෂික සඵල පොළී අනුපාතිකය (AER) පිළිබඳව දැනගැනීම සඳහා කරුණාකර,	• මැන්ඩේට් පත්‍රය සම්පූර්ණ කිරීම. • KYC අවශ්‍යතාවය • වලංගු ජාතික හැඳුනුම්පතෙහි (NIC) පිටපතක් සහ ජාතික හැඳුනුම්පත නොමැති නම්, ජා.හැ.පත් අංකය සඳහන්වන රියදුරු බලපත්‍රය/ විදේශ ගමන් බලපත්‍රය. • ලිපිනය සනාථ කිරීමක්	• වයස අවුරුදු 18 වඩා වැඩි වයස් කාණ්ඩයේ සිටින ශ්‍රී ලංකාවේ නේවාසිකයන් වන ශ්‍රී ලාංකික කාන්තා පුරවැසියන් • ගිණුම් විවෘත කිරීමේ ආරම්භක තැන්පතු මුදල ශ්‍රී.ල.රු. 5,000/- ක් වේ • මාසික අවම සාමාන්‍ය ශේෂය ශ්‍රී.ල.රු. 2,500/- ක් වේ

	• මාසික ඉතිරිකිරීමේ ප්‍රතිඥාවක් (පොරොන්දුවක්) ලබාදීම සහ එම පොරොන්දුව ඉටු කිරීමේ දී ගිණුම අතිරේක (බෝනස්) පොළිය සඳහා හිමිකම් ලැබීම	NDB බැංකු වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.	(අවශ්‍ය වේනම්)	

මූලික තොරතුරු ලේඛනය - NDB ජංගම ගිණුම

නිෂ්පාදනය/ සේවය	දිරිගැන්වීම් සහ ප්‍රවර්ධන ඇතුලු මූල්‍යමය සහ වෙනත් ප්‍රතිලාභ	ගාස්තු/ අයකිරීම් කොමිස් මුදල්, පොළිය	නිෂ්පාදනය/ සේවය ලබා ගැනීම සඳහා අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය	ප්‍රධාන නියම හා කොන්දේසි
NDB සාමාන්‍ය ජංගම ගිණුම	• NEOS ජංගම බැංකු සේවය සහ මාර්ගගත බැංකු සේවා පහසුකම මෙන්ම විද්‍යුත් ප්‍රකාශ පහසුකම සඳහා සුදුසුකම් ලැබීම • නිත්‍ය නියෝග පහසුකම සඳහා සුදුසුකම් ලැබීම • ස්වීප් ඉන්/ ස්වීප් අවුට් පහසුකම් සඳහා සුදුසුකම් ලැබීම • දිවයින පුරා පවතින ශාඛා ජාලය හරහා පහසුවෙන් මුදල් තැන්පත්කිරීම/ මුදල් ආපසු ගැනීම/ ගිණුම් අතර මුදල් හුවමාරු කිරීම සහ	සවිස්තරාත්මක සහ අලුත්ම ගාස්තු මෙන්ම අවම ශේෂ අවශ්‍යතා දැනගැනීම සඳහා කරුණාකර NDB වෙබ් අඩවියේ	• ශාඛා කළමනාකරු විසින් පවත්වනු ලබන පුද්ගලික සම්මුඛ පරීක්ෂණයක් • මැන්ඩේට් පත්‍රය සම්පූර්ණ කිරීම • හඳුන්වාදීම (දැනට සිටින ජංගම ගිණුම් හිමියකු විසින් සිදුකරන) • KYC අවශ්‍යතාවය (ඔබගේ ගනුදෙනුකරු හඳුනාගන්න) • වලංගු ජාතික හැඳුනුම්පතෙහි (NIC) පිටපතක් සහ ජාතික	• වයස අවුරුදු 18 ට වැඩි ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් • ආරම්භක තැනැප්තුව සහ අවම සාමාන්‍ය ශේෂ මුදල පිළිබඳ දැනගැනීම සඳහා කරුණාකර NDB වෙඩ් අඩවියේ පවතින

	තෝරාගත් ශාඛාවලදී දීර්සකරන ලද කාලසීමාවල දී බැංකු පහසුකම් ලබා ගැනීමේ පහසුකම. • වීසා (Visa) සේවා පහසුකම් සහිත ඩෙබිට් කාඩ්පත හරහා ලෝකයේ ඕනෑම තැනක සිට පැය 24 පුරා ඔබගේ ගිණුම වෙත ප්‍රවේශ වීමේ හැකියාව.	පවතින ගාස්තු අත්පොත කියවා බලන්න.	හැඳුනුම්පත නොමැති නම්, ජා.හැ.පත් අංකය සඳහන්වන රියදුරු බලපත්‍රය/ විදේශ ගමන් බලපත්‍රය. • ලිපිනය සනාථ කිරීමක් (අවශ්‍ය වේනම්)	ගාස්තු අත්පොත කියවා බලන්න

මූලික තොරතුරු ලේඛනය - NDB ස්ථාවර තැන්පතු ගිණුම

නිෂ්පාදනය/ සේවය	දිරිගැන්වීම් සහ ප්‍රවර්ධන ඇතුලු මූල්‍යමය සහ වෙනත් ප්‍රතිලාභ	ගාස්තු/ අයකිරීම් කොමිස් මුදල්, පොළිය	නිෂ්පාදනය/ සේවය ලබා ගැනීම සඳහා අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය	ප්‍රධාන නියම හා කොන්දේසි
NDB ස්ථාවර තැන්පතු ගිණුම	• NDB වෙබ් අඩවියේ "තැන්පතු මත වන පොළී අනුපාතික" යටතේ විස්තර කර ඇති පරිදි තැන්පතු කාලසීමා තෝරාගැනීමේ අවස්ථා පැවතීම • අදාල වන පරිදි කල්පිරීමේ දී, මාසිකව, කාර්තු වශයෙන් හෝ වාර්ෂිකව පොළිය ගෙවීම • බැංකුව විසින් තීරණය කරනු ලබන පරිදි ඔබගේ ස්ථාවර තැන්පතුවේ/ තැන්පතුවල වටිනාකමෙන් ප්‍රතිශතයක්	• අලුත්ම පොළී අනුපාතික සහ වාර්ෂික සඵල පොළී අනුපාතිකය (AER) පිළිබඳව දැනගැනීම සඳහා කරුණාකර NDB බැංකු වෙබ් අඩවිය වෙත පිවිසෙන්න	• යථා පරිදි අත්සන් කරන ලද මැන්ඩේට් පත්‍රය • KYC සම්පූර්ණ කිරීම • දෙමව්පිය/ භාරකරුගේ වලංගු ජාතික හැඳුනුම්පතෙහි (NIC) පිටපතක් සහ ජාතික හැඳුනුම්පත නොමැති නම්, ජා.හැ.පත් අංකය සඳහන් වන රියදුරු බලපත්‍රය/ විදේශ ගමන් බලපත්‍රය	• තැන්පතුව කල් පිරීමට පෙර කරනු ලබන ඕනෑම මුදල් ආපසු ලබා ගැනීමකදී, කල්පිරීමට ඇති ඉතිරි කාලය සැලකිල්ලට ගනිමින් දඩ අනුපාතිකයක් අදාල කරගනු ලැබේ

	දක්වා, ඔබගේ ස්ථාවර තැන්පතුවට එරෙහිව (අයිරාව/ ණය/ ණයවරලිපිය/ ඇපකරය වැනි) මුදල් ආපසු ලබාදීමේ පහසුකම් පැවතීම	• කල්පිරීමට පෙරාතුව මුදල් ආපසු ලබාගැනීම් බැංකුව විසින් තීරණය කරනු ලබන යම් දඩ මුදල් සහ ගාස්තු අයකිරීම් වලට යටත් වන්නේ ය	• ලිපිනය සනාථ කිරීමක් (අවශ්‍ය වේ නම්) • යථා පරිදි අත්සන් කරන ලද රඳවුම් බදු (WHT) ප්‍රකාශනය (අදාල වේ නම්)	• ගිණුමට බැර කරන ලද පොළිය පවත්නා රඳවුම් බදු (WHT) නියෝගවලට යටත් වේ

මූලික තොරතුරු ලේඛනය - NDB මයිනර් සේවින්ග්ස් ප්ලෑනර් ගිණුම

නිෂ්පාදනය/ සේවය	දිරිගැන්වීම් සහ ප්‍රවර්ධන ඇතුලු මූල්‍යමය සහ වෙනත් ප්‍රතිලාභ	ගාස්තු/ අයකිරීම් කොමිස් මුදල්, පොළිය	නිෂ්පාදනය/ සේවය ලබා ගැනීම සඳහා අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය	ප්‍රධාන නියම හා කොන්දේසි
NDB මයිනර් සේවින්ග්ස් ප්ලෑනර් ගිණුම	• ශ්‍රී.ල.රු. 250,000 සිට ශ්‍රී.ල.රු. මිලියන 10 දක්වා ඉතුරුම් සැලසුම් පැවතීම • අවුරුදු 1 සිට 18 දක්වා ගෙවීම් කාලසීමා පැවතීම • දෛනික පදනමක් මත පොළිය ගණනය කර මයිනර් සේවින්ග්ස් ප්ලෑනර් ගිණුම	• ආයෝජන කාලසීමාව පුරාවටම සහතික කරන ලද පොලී අනුපාතය පැවතීම • කල් පිරීමට පෙර මුදල් ආපසු ගැනීම්වලට අවසර නොමැති නමුත් අධ්‍යාපනික/ අසාධ්‍ය වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍යතාවයක් සඳහා මුදල් අවශ්‍ය වුවහොත්, බැංකු ශාඛා කළමනාකරුගේ පරම අභිමතය පරිදි මුදල් නිදහස් කිරීම.	• දෙමව්පියන්/ භාරකරු විසින් මැන්ඩේට් පත්‍රය සම්පූර්ණ කිරීම • "NDB සේවින්ග්ස් ප්ලෑනර්" ගිණුමේ නියම සහ කොන්දේසි පිළිගැනීම • KYC අවශ්‍යතාවය	• NDB මයිනර් සේවින්ග්ස් ප්ලෑනර් ගිණුම බාලවයස්කරුවකු වෙනුවෙන් දෙමව්පියකු/ භාරකරුවකු

	සඳහා ගෙවීම් කලයුතු දිනයේදී එම පොලිය බැර කිරීම • (අ) මාසිකව ගෙවීමේ අවස්ථාවක් ද සමග එකවර ගෙවීමක් හෝ (ආ) මාසිකව ගෙවීමේ අවස්ථාව යන දෙකෙන් එකක් තෝරා ගැනීමට ඇති හැකියාව • NEOS ජංගම බැංකු සේවය සහ මාර්ගගත බැංකු සේවා පහසුකම මගින් ශේෂයන් බැලීමට හැකිවීම	• කල් පිරීමට පෙර ගිණුම වසාදැමීම සිදු වුවහොත් දඩ අනුපාතිකයකට යටත් වනු ඇත. • ගාස්තු සහ අයකිරීම් දැනගැනීම සඳහා කරුණාකර NDB වෙබ් අඩවියේ පවතින ගාස්තු අත්පොත කියවා බලන්න • අලුත්ම පොළී අනුපාතිකය සහ වාර්ෂික සඵල පොළී අනුපාතිකය (AER) පිළිබඳව දැනගැනීම සඳහා කරුණාකර NDB බැංකු වෙබ් අඩවිය වෙත පිවිසෙන්න • ගනුදෙනුකරු මාසික වාරික ගෙවීම් නියමිත පරිදි සිදු නොකරයි නම් සහ ගෙවීම් අඛණ්ඩව සිදු නොකරයි නම්, කල්පිරීම් දිනය දක්වා සේවින්ග්ස් ප්ලෑනර් ගිණුම පවත්වාගෙන යනු ලැබේ. එසේ වුව ද, සහතික පත්‍රයේ සඳහන් කල්පිරීම් අගය සඳහා ගනුදෙනුකරු සුදුසුකම් නොලබයි.	• වලංගු ජාතික හැඳුනුම්පතෙහි (NIC) පිටපතක් සහ ජාතික හැඳුනුම්පත නොමැති නම්, ජා.හැ.පත් අංකය සඳහන් වන රියදුරු බලපත්‍රය/ විදේශ ගමන් බලපත්‍රය • බාලවයස්කරුගේ උප්පැන්න සහතිකය • ලිපිනය සනාථ කිරීමක් (අවශ්‍ය වේ නම්)	විසින් විවෘත කළ යුතු ය • ඉලක්කගත මුදල අදාල වේ නම් රජයේ බදුවලට යටත් වේ • මයිනර් සේවින්ග්ස් ප්ලෑනර් ගිණුමේ කාලසීමාව බාලවයස්කරු වයස අවුරුදු 18 ට එළඹෙන තෙක් පමණක් විය යුතුය

මූලික තොරතුරු ලේඛනය - NDB සේවින්ග්ස් ප්ලෑනර් ගිණුම

නිෂ්පාදනය/ සේවය	දිරිගැන්වීම් සහ ප්‍රවර්ධන ඇතුලු මූල්‍යමය සහ වෙනත් ප්‍රතිලාභ	ගාස්තු/ අයකිරීම් කොමිස් මුදල්, පොළිය	නිෂ්පාදනය/ සේවය ලබා ගැනීම සඳහා අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය	ප්‍රධාන නියම හා කොන්දේසි
NDB සේවින්ග්ස් ප්ලෑනර් ගිණුම	• ශ්‍රී.ල.රු. 250,000 සිට ශ්‍රී.ල.රු. මිලියන 10 දක්වා ඉතුරුම් සැලසුම් පැවතීම • අවුරුදු 1 සිට 10 දක්වා ඉතුරුම් සැලසුම් කාලසීමා පැවතීම • දෛනික පදනමක් මත පොළිය ගණනය කර සේවින්ග්ස් ප්ලෑනර් ගිණුම සඳහා ගෙවීම් කලයුතු දිනයේ දී පොළිය බැර කිරීම • (අ) මාසිකව ගෙවීමේ අවස්ථාවක් සමග එකවර ගෙවීමක් හෝ (ආ) මාසිකව ගෙවීමේ අවස්ථාව යන දෙකෙන් එක් අවස්ථාවක් තෝරා ගැනීමට ඇති හැකියාව	• ආයෝජන කාලසීමාව පුරාවට සහතික කරන ලද පොළී අනුපාතිකයක් පැවතීම • කල්පිරීමට පෙර ගිණුම වසා දැමීම සිදුවුවහොත් ගිණුම දඩඅනුපාතිකයකට යටත් වනු ඇත • සවිස්තරාත්මක සහ අලුත්ම ගාස්තු මෙන්ම අවම ශේෂ අවශ්‍යතා දැනගැනීම සඳහා කරුණාකර NDB වෙබ් අඩවියේ පවතින ගාස්තු අත්පොත කියවා බලන්න. • අලුත්ම පොළී අනුපාතිකය සහ වාර්ෂික සඵල පොළී අනුපාතිකය (AER) පිළිබඳව දැනගැනීම සඳහා කරුණාකර, NDB බැංකු වෙබ් අඩවිය වෙත පිවිසෙන්න • ගනුදෙනුකරු මාසික වාරික ගෙවීම් නියමිත පරිදි සිදු නොකරයි නම් සහ ගෙවීම් අඛණ්ඩව සිදු නොකරයි නම්, කල්පිරීම් දිනය දක්වා සේවින්ග්ස් ප්ලෑනර් ගිණුම	• මැන්ඩේට් බලපත්‍රය සම්පූර්ණ කිරීම • "NDB සේවින්ග්ස් ප්ලෑනර්" ගිණුම නියම සහ කොන්දේසි පිළිගැනීම • KYC අවශ්‍යතාවය • වලංගු ජාතික හැඳුනුම්පතෙහි (NIC) පිටපතක් සහ ජාතික හැඳුනුම්පත නොමැති නම්, ජා.හැ.පත් අංකය සඳහන් වන රියදුරු	• ජාතික හැඳුනුම්පතක් දරන්නා වූ ද වයස අවුරුදු 18 ට වඩා වැඩි ශ්‍රී ලංකාවේ පදිංචිකරුවකුට NDB සේවින්ග්ස් ප්ලෑනර් ගිණුමක් විවෘත කළ හැකි වේ • අදාල වේ නම් ඉලක්කගත මුදල රජයේ බදුගෙවීමට යටත් වේ

	• NEOS ජංගම බැංකු සේවය සහ මාර්ගගත බැංකු සේවා පහසුකම මගින් ශේෂයන් බැලීමට හැකිවීම	පවත්වාගෙන යනු ලැබේ. එසේ වුව ද, සහතික පත්‍රයේ සඳහන් කල්පිරීම් අගය සඳහා ගනුදෙනුකරු සුදුසුකම් නොලබයි. අවසාන මාස 6 ක කාලයක් සඳහා මාසික වාරික අඛණ්ඩව ලැබී නොමැති නම්, පොළී අනුපාතිකය ඊසි සේවර් අනුපාතිකයට පරිවර්තනය කරනු ලැබේ.	බලපත්‍රය/ විදේශ ගමන් බලපත්‍රය • ලිපිනය සනාථ කිරීමක් (අවශ්‍ය වේ නම්)	

මූලික තොරතුරු ලේඛනය - NDB ශිල්ප ළමා ඉතිරිකිරීමේ ගිණුම (බාලවයස්කරුවන් සඳහා)

නිෂ්පාදනය/ සේවය	දිරිගැන්වීම් සහ ප්‍රවර්ධන ඇතුලු මූල්‍යමය සහ වෙනත් ප්‍රතිලාභ	ගාස්තු/ අයකිරීම් කොමිස් මුදල්, පොළිය	නිෂ්පාදනය/ සේවය ලබා ගැනීම සඳහා අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය	ප්‍රධාන නියම හා කොන්දේසි
NDB ශිල්ප ළමා ඉතිරිකිරීමේ ගිණුම	• ශ්‍රී.ල.රු. 500/- ක අවම මාසික ඉතිරි කිරීමේ ප්‍රතිඥාවක් (පොරොන්දුවක්) ලබාදීම සහ එම පොරොන්දුව ඉටු කිරීමේ දී ගිණුම බෝනස් පොළිය සඳහා හිමිකම් ලැබීම • දෛනික ශේෂය මත පොළිය ගණනය කර මාසිකව ගිණුමට බැර කිරීම	සවිස්තරාත්මක සහ අලුත්ම ගාස්තු මෙන්ම අවම ශේෂ අවශ්‍යතා දැනගැනීම සඳහා කරුණාකර NDB වෙබ් අඩවියේ පවතින	• දෙමව්පිය/ භාරකරු විසින් යථාපරිදි අත්සන් කරන ලද සම්පූර්ණ මැන්ඩේට් පත්‍රය • ළමයාගේ උප්පැන්න සහතිකයේ පිටපතක්	• අවම ආරම්භක තැන්පතුව ශ්‍රී.ල.රු. 2,500/- ක් වේ • ළමයා වයස අවුරුදු 18 සම්පූර්ණ කරන

	• දෙමව්පියන් සඳහා නොමිලේ ජීවිතරක්ෂණයක් සහ පූර්ණ ආබාධිත අකර්මණ්‍ය රක්ෂණාවරණයක් ලබාදීම සහ අවුරුදු එකට වඩා වැඩි ළමුන් සඳහා නොමිලේ රෝහල්ගත කිරීමේ දී ලබාදෙන ආවරණයක් තිබීම (ආවරණ සීමාවන්ට යටත්ව) • ළමයා සඳහා ආකර්ෂණීය ත්‍යාග යෝජනා ක්‍රමයක් ලබාදීම • 5 වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සහ අ.පො.ස. සා/පෙළ විභාග ජයග්‍රාහකයන් අගය කිරීමේ වැඩසටහන පැවතීම • NEOS ජංගම බැංකු සේවය සහ මාර්ගගත බැංකු සේවා පහසුකම මගින් දෙමව්පියන්ට/ භාරකරුට ශේෂය බැලීමට හැකිවීම	ගාස්තු අත්පොත කියවා බලන්න. අලුත්ම පොළී අනුපාතිකය සහ වාර්ෂික සඵල පොළී අනුපාතිකය (AER) පිළිබඳව දැනගැනීම සඳහා කරුණාකර, NDB බැංකු වෙබ් අඩවිය වෙත පිවිසෙන්න	• දෙමව්පිය/ භාරකරුගේ වලංගු ජාතික හැඳුනුම්පතෙහි (NIC) පිටපතක් සහ ජාතික හැඳුනුම්පත නොමැති නම්, ජා.හැ.පත් අංකය සඳහන් වන රියදුරු බලපත්‍රය/ විදේශ ගමන් බලපත්‍රය • ලිපිනය සනාථ කිරීමක් (අවශ්‍ය වේ නම්)	තෙක් මුදල් ආපසු ගැනීමට නොහැකි වේ • අතිරේක (බෝනස්) පොළියට හිමිකම් ලැබීම සඳහා මාසිකව පොරොන්දු මුදල ගිල්ප ගිණුමට බැර කල යුතු වේ • මෙම ගිණුම බැංකු පාස්පොත් ඉතිරිකිරීමේ ගිණුමක් වේ

මූලික තොරතුරු ලේඛනය - NDB ප්‍රිවිලේජ් ජූනියර් ළමා ඉතිරිකිරීමේ ගිණුම (බාලවයස්කරුවන් සඳහා)

නිෂ්පාදනය/ සේවය	දිරිගැන්වීම් සහ ප්‍රවර්ධන ඇතුලු මූල්‍යමය සහ වෙනත් ප්‍රතිලාභ	ගාස්තු/ අයකිරීම් කොමිස් මුදල්, පොළිය	නිෂ්පාදනය/ සේවය ලබා ගැනීම සඳහා අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය	ප්‍රධාන නියම හා කොන්දේසි

NDB ප්‍රිවිලේජ් ජූනියර් ළමා ඉතිරිකිරීමේ ගිණුම	• ශ්‍රී.ල.රු. 10,000/- ක අවම මාසික ඉතිරි කිරීමේ ප්‍රතිඥාවක් (පොරොන්දුවක්) ලබාදීම සහ එම පොරොන්දුව ඉටු කිරීමේ දී ගිණුම අතිරේක (බෝනස්) පොළියක් සඳහා හිමිකම් ලැබීම • දෛනික ශේෂය මත පොළිය ගණනය කර මාසිකව ගිණුමට බැර කිරීම • ළමයා සඳහා ආකර්ශණීය ත්‍යාග වවුචර්පත් යෝජනා ක්‍රමයක් පැවතීම • NEOS ජංගම බැංකු සේවය සහ මාර්ගගත බැංකු සේවා පහසුකම හරහා දෙමව්පියන්ට/ භාරකරුට ප්‍රිවිලේජ් ජූනියර් ගිණුමේ ශේෂ සහ ගිණුම් ප්‍රකාශ බැලීමේ අවස්ථාව පැවතීම	සවිස්තරාත්මක සහ අලුත්ම ගාස්තු මෙන්ම අවම ශේෂ අවශ්‍යතා දැනගැනීම සඳහා කරුණාකර NDB වෙබ් අඩවියේ පවතින ගාස්තු අත්පොත කියවා බලන්න. අලුත්ම පොළී අනුපාතිකය සහ වාර්ෂික සඵල පොළී අනුපාතිකය (AER) පිළිබඳව දැනගැනීම සඳහා කරුණාකර, NDB බැංකු වෙබ් අඩවිය වෙත පිවිසෙන්න	• ළමයා සහ දෙමව්පියකු භාරකරු විසින් යථා පරිදි අත්සන් කරන ලද සම්පූර්ණ කරන ලද මැන්ඩේට් පත්‍රය • ළමයාගේ උප්පැන්න සහතිකයේ පිටපතක් • දෙමව්පිය/ භාරකරුගේ වලංගු ජාතික හැඳුනුම්පතෙහි (NIC) පිටපතක් සහ ජාතික හැඳුනුම්පත නොමැති නම්, ජා.හැ.පත් අංකය සඳහන් වන රියදුරු බලපත්‍රය/ විදේශ ගමන් බලපත්‍රය • ලිපිනය සනාථ කිරීමක් (අවශ්‍ය වේ නම්)	• අවම ආරම්භක තැන්පතුව ශ්‍රී.ල.රු. 1,000,000/- ක් වේ • ළමයා වයස අවුරුදු 18 සම්පූර්ණ කරනතෙක් මුදල් ආපසු ගැනීමට නොහැකි වේ • අතිරේක (බෝනස්) පොළියට හිමිකම් ලැබීම සඳහා මාසිකව පොරොන්දු මුදල ප්‍රිමිලේජ් ජූනියර් ගිණුමට බැරකළ යුතු වේ

මූලික තොරතුරු ලේඛනය - පික්සල් ඩිජිටල් ළමා ඉතුරුම් ගිණුම (බාලවයස්කරුවන් සඳහා)

නිෂ්පාදනය/ සේවය	දිරිගැන්වීම් සහ ප්‍රවර්ධන ඇතුලු මූල්‍යමය සහ වෙනත් ප්‍රතිලාභ	ගාස්තු/ අයකිරීම් කොමිස් මුදල්, පොළිය	නිෂ්පාදනය/ සේවය ලබා ගැනීම සඳහා අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය	ප්‍රධාන නියම හා කොන්දේසි

පික්සල් ඩිජිටල් ළමා ඉතුරුම් ගිණුම	• දෛනික ශේෂය මත පොළිය ගණනය කර මාසිකව ගිණුමට බැර කිරීම • දෛනික ගනුදෙනු කිරීමේ සිමාවක් ද සහිතව, දෙමව්පිය/ භාරකරුගේ වගකීම සහ බැඳීම යටතේ ඩෙබිට් කාඩ්පතක් බාලවයස්කරු වෙත නිකුත් කිරීම • දෙමාපිය/ භාරකරුගේ වගකීම සහ බැඳීම යටතේ බැංකුව විසින් කලින්කල තීරණය කරනු ලබන ආකාරයේ දෛනික ගනුදෙනු කිරීමේ සීමාවක් ද සහිතව, බාලවයස්කරුට NEOS හරහා ඩිජිටල් ගනුදෙනු කිරීමට හැකියාව ලැබීම	සවිස්තරාත්මක සහ අලුත්ම ගාස්තු මෙන්ම අවම ශේෂ අවශ්‍යතා දැනගැනීම සඳහා කරුණාකර NDB වෙබ් අඩවියේ පවතින ගාස්තු අත්පොත කියවා බලන්න. අලුත්ම පොළී අනුපාතිකය සහ වාර්ෂික සඵල පොළී අනුපාතිකය (AER) පිළිබඳව දැනගැනීම සඳහා කරුණාකර, NDB බැංකු වෙබ් අඩවිය වෙත පිවිසෙන්න	• ළමයා සහ දෙමව්පියකු / භාරකරු විසින් යථා පරිදි අත්සන් කරන ලද සහ සම්පූර්ණ කරන ලද මැන්ඩේට් පත්‍රය • ළමයාගේ උප්පැන්න සහතිකයේ පිටපතක් • දෙමව්පිය/ භාරකරුගේ වලංගු ජාතික හැඳුනුම්පතෙහි (NIC) පිටපතක් සහ ජාතික හැඳුනුම්පත නොමැති නම්, ජා.හැ.පත් අංකය සඳහන් වන රියදුරු බලපත්‍රය/ විදේශ ගමන් බලපත්‍රය • ලිපිනය සනාථ කිරීමක් (අවශ්‍ය වේ නම්)	• අවම ආරම්භක තැන්පතුව ශ්‍රී.ල.රු. 5,000/- ක් වේ • බැංකුව විසින් කලින් කල තීරණය කරනු ලබන දෛනික සීමා අනුව දෙමාපිය/ භාරකරුගේ වගකීම සහ බැඳීම යටතේ ඩෙබිට් කාඩ්පත හෝ NEOS මගින් මුදල් ආපසු ගැනීම්/ ගනුදෙනු කිරීම් සඳහා බාලවයස්කරුට අවසර ලැබේ • ගිණුමෙන් හෝ ගිණුම වෙතට ගනුදෙනු සිදුවන අවස්ථාවේ දී පණිවුඩ උත්පාදනය කිරීම සඳහා ළමයාට සහ දෙමව්පියන්ට/ භාරකරුට SMS පහසුකම ලබාදේ

මූලික තොරතුරු ලේඛනය - රියල් සේවර් ගිණුම (RSA)

නිෂ්පාදනය/ සේවය	දිරිගැන්වීම් සහ ප්‍රවර්ධන ඇතුලු මූල්‍යමය සහ වෙනත් ප්‍රතිලාභ	ගාස්තු/ අයකිරීම් කොමිස් මුදල්, පොළිය	නිෂ්පාදනය/ සේවය ලබා ගැනීම සඳහා අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය	ප්‍රධාන නියම හා කොන්දේසි
රියල් සේවර් ගිණුම (RSA) - බෝනස් පොලියක් සඳහා හිමිකම් මාසික පොරොන්දුවක් සහිත ඉතිරිකිරීමේ ගිණුම	• මාසික ඉතිරිකිරීමේ ප්‍රතිඥාවක් (පොරොන්දුවක්) ලබාදීම සහ එම පොරොන්දුව ඉටු කිරීමේ දී ගිණුම බෝනස් පොළිය සඳහා හිමිකම් ලැබීම • දෛනික ශේෂය මත පොළිය ගණනය කර, මාසිකව ගිණුමට බැර කිරීම • NEOS ජංගම බැංකු සේවය සහ මාර්ගගත බැංකු සේවා පහසුකම සහ විද්‍යුත් ප්‍රකාශ පහසුකම සඳහා සුදුසුකම් ලැබීම • දිවයින පුරා පවතින ශාඛා ජාලය හරහා පහසුවෙන් මුදල් තැන්පත්කිරීම/ මුදල් ආපසු ගැනීම/ ගිණුම් අතර මුදල් හුවමාරු කිරීම සහ තෝරාගත් ශාඛාවලදී දීර්ඝකරන ලද කාලසීමාවලදී බැංකු පහසුකම් ලබා ගැනීමේ පහසුකම.	සවිස්තරාත්මක සහ අලුත්ම ගාස්තු මෙන්ම අවම ශේෂ අවශ්‍යතා දැනගැනීම සඳහා කරුණාකර NDB වෙබ් අඩවියේ පවතින ගාස්තු අත්පොත කියවා බලන්න. අලුත්ම පොළී අනුපාතිකය සහ වාර්ෂික සඵල පොළී අනුපාතිකය (AER) පිළිබඳව දැනගැනීම සඳහා කරුණාකර, NDB බැංකු වෙබ් අඩවිය වෙත පිවිසෙන්න	• මැන්ඩේට් පත්‍රය සම්පූර්ණ කිරීම • KYC අවශ්‍යතාවය • වලංගු ජාතික හැඳුනුම්පතෙහි (NIC) පිටපතක් සහ ජාතික හැඳුනුම්පත නොමැති නම්, ජා.හැ.පත් අංකය සඳහන් වන රියදුරු බලපත්‍රය/ විදේශ ගමන් බලපත්‍රය • මාසික පොරොන්දු ප්‍රකාශනය සහ නියම හා කොන්දේසි • ලිපිනය සනාථ කිරීමක් (අවශ්‍ය වේ නම්)	• වයස අවුරුදු 18 ට වඩා වැඩි ශ්‍රී ලංකාවේ පදිංචිකරුවන් වීම • ආරම්භක තැන්පතුව ශ්‍රී.ල.රු. 10,000/- ක් වේ • අතිරේක (බෝනස්) පොළිය සඳහා හිමිකම් ලැබීමට මාසික පොරොන්දු මුදල RSA ගිණුමට තැන්පත් කළ යුතු වේ • ඉහත සඳහන් කළ අතිරේක (බෝනස්) පොළිය අහිමි කරගැනීමෙන් තොරව එක් මුදල් ආපසු ගැනීමක් කළ හැකි වේ • මෙම ගිණුම බැංකු පාස් පොත් ඉතිරිකිරීමේ ගිණුමක් වේ

මූලික තොරතුරු ලේඛනය - සැලරී මැක්ස් ජංගම ගිණුම

නිෂ්පාදනය/ සේවය	දිරිගැන්වීම් සහ ප්‍රවර්ධන ඇතුලු මූල්‍යමය සහ වෙනත් ප්‍රතිලාභ	ගාස්තු/ අයකිරීම් කොමිස් මුදල්, පොළිය	නිෂ්පාදනය/ සේවය ලබා ගැනීම සඳහා අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය	ප්‍රධාන නියම හා කොන්දේසි

සැලරි මැක්ස් ජංගම ගිණුම (වැටුප් ලබන කාණ්ඩය සඳහා වන ගිණුම)	• පුද්ගලකරණය කරන ලද පත්‍රිකා 10 ක් හෝ 25 ක් සහිත පළමු චෙක්පොත නොමිලේ ලබා දීම • NEOS ජංගම බැංකු සේවය සහ මාර්ගගත බැංකු සේවා පහසුකම සහ විද්‍යුත් ප්‍රකාශ පහසුකම සඳහා සුදුසුකම් ලැබීම • ගිණුම විවෘත කිරීමෙන් පළමු මාස තුන ඇතුලත එක් නිත්‍ය නියෝගයක් නොමිලේ පිහිටුවිය හැකි වීම • ස්වීප් ඉන්/ ස්වීප් අවුට් පහසුකම් සඳහා සුදුසුකම් ලැබීම • දිවයින පුරා පවතින ශාඛා ජාලය හරහා පහසුවෙන් මුදල් තැන්පත්කිරීම/ මුදල් ආපසු ගැනීම/ ගිණුම් අතර මුදල් හුවමාරු කිරීම සහ තෝරාගත් ශාඛාවලදී දීර්ඝකරන ලද කාලසීමාවල දී බැංකු පහසුකම් ලබා ගැනීමේ පහසුකම. • වීසා (Visa) සේවා පහසුකම් සහිත ඩෙබිට් කාඩ්පත හරහා ලෝකයේ ඕනෑම තැනක සිට පැය 24 පුරා ඔබගේ ගිණුම වෙත ප්‍රවේශ වීමේ හැකියාව. • ක්‍රෙඩිට් කාඩ්පත් බැංකුව විසින් නියම කරනු ලබන නියම සහ කොන්දේසිවලට යටත් වීම • පුද්ගලික ණය බැංකුව විසින් නියම කරනු ලබන නියම සහ කොන්දේසිවලට යටත් වීම	සවිස්තරාත්මක සහ අලුත්ම ගාස්තු මෙන්ම අවම ශේෂ අවශ්‍යතා දැනගැනීම සඳහා කරුණාකර NDB වෙබ් අඩවියේ පවතින ගාස්තු අත්පොත කියවා බලන්න.	• බැංකු කළමනාකරු විසින් පවත්වනු ලබන පෞද්ගලික සම්මුඛ පරීක්ෂණය • මැන්ඩේට් පත්‍රය සම්පූර්ණ කිරීම • හඳුන්වාදීම (දැනට සිටින ජංගම ගිණුම් හිමියකු විසින්) • KYC අවශ්‍යතාවය • වලංගු ජාතික හැඳුනුම්පතෙහි (NIC) පිටපතක් සහ ජාතික හැඳුනුම්පත නොමැති නම්, ජා.හැ.පත් අංකය සඳහන් වන රියදුරු බලපත්‍රය/ විදේශ ගමන් බලපත්‍රය • ලිපිනය සනාථ කිරීමක් (අවශ්‍ය වේ නම්)	• වයස අවුරුදු 18 ට වඩා වැඩි ශ්‍රී ලංකාවේ පදිංචිකරුවන් වීම • අවම සාමාන්‍ය ශේෂ අවශ්‍යතාවයක් නොමැති වීම

මූලික තොරතුරු ලේඛනය - සැලරි මැක්ස් ඉතිරිකිරීමේ ගිණුම

නිෂ්පාදනය/ සේවය	දිරිගැන්වීම් සහ ප්‍රවර්ධන ඇතුලු මූල්‍යමය සහ වෙනත් ප්‍රතිලාභ	ගාස්තු/ අයකිරීම් කොමිස් මුදල්, පොළිය	නිෂ්පාදනය/ සේවය ලබා ගැනීම සඳහා අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය	ප්‍රධාන නියම හා කොන්දේසි
සැලරි මැක්ස් ඉතිරිකිරීමේ ගිණුම (වැටුප් ලබන කාණ්ඩය සඳහා වන ගිණුම)	• දෛනික ශේෂය මත පොළිය ගණනයකර මාසිකව ගිණුමට බැරකිරීම • NEOS ජංගම බැංකු සේවය සහ මාර්ගගත බැංකු සේවා පහසුකම මෙන්ම විද්‍යුත් ප්‍රකාශ පහසුකම සඳහා සුදුසුකම් ලැබීම • නිත්‍ය නියෝග පහසුකම සඳහා සුදුසුකම් ලැබීම • ස්වීප් ඉන්/ ස්වීප් අවුට් පහසුකම් සඳහා සුදුසුකම් ලැබීම • දිවයින පුරා පවතින ශාඛා ජාලය හරහා පහසුවෙන් මුදල් තැන්පත්කිරීම/ මුදල් ආපසු ගැනීම/ ගිණුම් අතර මුදල් හුවමාරු කිරීම සහ තෝරාගත් ශාඛාවලදී දීර්ඝකරන ලද කාලසීමාවල දී බැංකු පහසුකම් ලබා ගැනීමේ පහසුකම. • වීසා (Visa) සේවා පහසුකම් සහිත ඩෙබිට් කාඩ්පත හරහා ලෝකයේ ඕනෑම තැනක සිට පැය 24 පුරා ඔබගේ ගිණුම වෙත ප්‍රවේශ වීමේ හැකියාව	සවිස්තරාත්මක සහ අලුත්ම ගාස්තු මෙන්ම අවම ශේෂ අවශ්‍යතා දැනගැනීම සඳහා කරුණාකර NDB වෙබ් අඩවියේ පවතින ගාස්තු අත්පොත කියවා බලන්න. අලුත්ම පොළී අනුපාතිකය සහ වාර්ෂික සඵල පොළී අනුපාතිකය (AER) පිළිබඳව දැනගැනීම	• මැන්ඩේට් පත්‍රය සම්පූර්ණ කිරීම • KYC අවශ්‍යතාවය • වලංගු ජාතික හැඳුනුම්පතෙහි (NIC) පිටපතක් සහ ජාතික හැඳුනුම්පත නොමැති නම්, ජා.හැ.පත් අංකය සඳහන් වන රියදුරු බලපත්‍රය/ විදේශ ගමන් බලපත්‍රය • ලිපිනය සනාථ කිරීමක් (අවශ්‍ය වේ නම්)	• වයස අවුරුදු 18 ට වඩා වැඩි ශ්‍රී ලංකාවේ පදිංචිකරුවන් වීම • ආරම්භක තැන්පතුව ශ්‍රී.ල.රු. 10,000/- ක් වේ •

	• ක්‍රෙඩිට් කාඩ්පත් බැංකුව විසින් නියම කරනු ලබන නියම සහ කොන්දේසිවලට යටත් වීම • පුද්ගලික ණය බැංකුව විසින් නියම කරනු ලබන නියම සහ කොන්දේසිවලට යටත් වීම	සඳහා කරුණාකර, NDB බැංකු වෙබ් අඩවිය වෙත පිවිසෙන්න		

මූලික තොරතුරු ලේඛනය - සැලරි මැක්ස් අයිරා/ ණය පහසුකම

නිෂ්පාදනය/ සේවය	දිරිගැන්වීම් සහ ප්‍රවර්ධන ඇතුලු මූල්‍යමය සහ වෙනත් කකප්‍රතිලාභ	ගාස්තු/ අයකිරීම් කොමිස් මුදල්, පොළිය	නිෂ්පාදනය/ සේවය ලබා ගැනීම සඳහා අනුගමනය කරනු	ප්‍රධාන නියම හා කොන්දේසි

			ලැබිය යුතු කාර්ය පටිපාටිය	
සැලරි මැක්ස් ණය ගිණුම - මාසික ශුද්ධ වැටුපට සමාන අත්තිකාරම් මුදලක් පහත දැක්වෙන යම් ගිණුමකට බැර කිරීම : සැලරි මැක්ස් ජංගම ගිණුම හෝ සැලරි මැක්ස් ඉතිරිකිරීමේ ගිණුම හෝ ඊසි සේවර් හෝ බිග් සේවර් හෝ අරලිය ඉතිරිකිරීමේ ගිණුම හෝ NDB Zee හෝ විෂ්මිත ඉතිරිකිරීමේ ගිණුම)	• එක් මසක ශුද්ධ වැටුපට සමාන අත්තිකාරම් මුදලක් ලැබීම • සමාන මාසික වාරික 12 කින් නැවත ගෙවීමේ හැකියාව • කලින් පියවීම හෝ කොටසක් පියවීම සම්බන්ධයෙන් පෙර ගෙවීම් ගාස්තු අදාල නොවීම • සැකසුම් ගාස්තු නොමැති වීම	සවිස්තරාත්මක සහ අලුත්ම ගාස්තු මෙන්ම අවම ශේෂ අවශ්‍යතා දැනගැනීම සඳහා කරුණාකර NDB වෙබ් අඩවියේ පවතින ගාස්තු අත්පොත කියවා බලන්න. අලුත්ම පොළී අනුපාතිකය සහ වාර්ෂික සඵල පොළී අනුපාතිකය (AER) පිළිබඳව දැනගැනීම සඳහා කරුණාකර, NDB බැංකු වෙබ් අඩවිය වෙත පිවිසෙන්න	• සැලරි මැක්ස් පහසුකමින් සුරක්ෂිත කරන ලද අයිරා සහ ණය සඳහා සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය • අවසාන මාස 3 හි සහතික කරන ලද වැටුප් පත්‍රිකා • ජාතික හැඳුනුම්පතේ පිටපතක්	• අයිරාව/ ණය මුදල කල් පිරීමේ දිනය වන විට වයස අවුරුදු 18 ට වඩා වැඩි සහ අවුරුදු 55 නොඉක්මවන ශ්‍රී ලංකාවේ නේවාසිකයන් වීම • NDB බැංකුව විසින් පූර්වයෙන් අනුමත කරන ලද සමාගමක සේවානියුක්තව සිටීම • ණය මුදලට සුදුසුකම් ලැබීම සඳහා ශ්‍රී.ල.රු. 75,000/- ට වඩා වැඩි මාසික වැටුපක් බැරවී තිබීම • අයිරාවට සුදුසුකම් ලැබීම සඳහා ශ්‍රී.ල.රු. 250,000 ට වඩා වැඩි මාසික වැටුපක් බැරවී තිබීම • ශ්‍රී.ල.රු. 500,000/- ක උපරිමයකට යටත්ව ඉල්ලුම් කළ දින සිට මාස තුනක් සඳහා වන වැටුප බැරකරන ලද ගිණුමේ අවම මුදල උපරිම ණය/ අයිරා මුදල් ප්‍රමාණය වීම

මූලික තොරතුරු ලේඛනය - විෂ්මිත ඉතිරිකිරීමේ ගිණුම

නිෂ්පාදනය/ සේවය	දිරිගැන්වීම් සහ ප්‍රවර්ධන ඇතුලු මූල්‍යමය සහ වෙනත් කකප්‍රතිලාභ	ගාස්තු/ අයකිරීම් කොමිස් මුදල්, පොළිය	නිෂ්පාදනය/ සේවය ලබා ගැනීම සඳහා අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය	ප්‍රධාන නියම හා කොන්දේසි
විෂ්මිත ඉතිරිකිරීමේ ගිණුම - අවුරුද්දකට පසුව සාමාන්‍ය ඉතුරුම් ශේෂවලින් 90% ක් දක්වා පොළී රහිත ණයක් ලබා දීම	• දෛනික ශේෂය මත පොළිය ගණනයකර මාසිකව ගිණුමට බැරකිරීම • NEOS ජංගම බැංකු සේවය සහ මාර්ගගත බැංකු සේවා පහසුකම මෙන්ම විද්‍යුත් ප්‍රකාශ පහසුකම සඳහා සුදුසුකම් ලැබීම • නිත්‍ය නියෝග පහසුකම සඳහා සුදුසුකම් ලැබීම • ස්වීප් ඉන්/ ස්වීප් අවුට් පහසුකම් සඳහා සුදුසුකම් ලැබීම • දිවයින පුරා පවතින ශාඛා ජාලය හරහා පහසුවෙන් මුදල් තැන්පත්කිරීම/ මුදල් ආපසු ගැනීම/ ගිණුම් අතර මුදල් හුවමාරු කිරීම සහ තෝරාගත් ශාඛාවලදී දීර්සකරන ලද කාලසීමාවල දී බැංකු පහසුකම් ලබා ගැනීමේ පහසුකම. • වීසා (Visa) සේවා පහසුකම් සහිත ඩෙබිට් කාඩ්පත හරහා ලෝකයේ ඕනෑම තැනක සිට	සවිස්තරාත්මක සහ අලුත්ම ගාස්තු මෙන්ම අවම ශේෂ අවශ්‍යතා දැනගැනීම සඳහා කරුණාකර NDB වෙබ් අඩවියේ පවතින ගාස්තු අත්පොත කියවා බලන්න අලුත්ම පොළී අනුපාතිකය සහ වාර්ෂික සඵල පොළී	• මැන්ඩේට් පත්‍රය සම්පූර්ණ කිරීම • KYC අවශ්‍යතාවය (ඔබගේ ගනුදෙනුකරු හඳුනාගන්න) • වලංගු ජාතික හැඳුනුම්පතෙහි (NIC) පිටපතක් සහ ජාතික හැඳුනුම්පත නොමැති නම්, ජා.හැ.පත් අංකය සඳහන් වන රියදුරු බලපත්‍රය/ විදේශ ගමන් බලපත්‍රය • ලිපිනය සනාථ කිරීමක් (අවශ්‍ය වේ නම්) • යථා පරිදි අත්සන් කරන ලද නියම හා	• වයස අවුරුදු 18 ට වැඩි ශ්‍රී ලංකාවේ නේවාසිකයකු වීම • විෂ්මිත ඉතිරිකිරීමේ ගිණුමක් විවෘත කිරීමේ අවම ආරම්භක තැන්පතු මුදල ශ්‍රී.ල.රු.1,000/- ක් වේ • පසුගිය මාස 12 සඳහා වැඩිවන සාමාන්‍ය ශේෂ වර්ධනයක් පවත්වාගෙන ගිය විෂ්මිත ඉතිරිකිරීමේ ගිණුම් හිමියන් පොළී රහිත ණය සඳහා සුදුසුකම් ලබයි • ආසන්නතම පූර්ව මාස 12 තුළ දෛනික ඉතුරුම් ශේෂයෙන් 90% ක් හෝ ණය ලබාදෙන දිනයේ දී ගිණුම වැසීමේ ශේෂයෙන් 90% ක් යන

	පැය 24 පුරා ඔබගේ ගිණුම වෙත ප්‍රවේශ වීමේ හැකියාව. • අවුරුද්දකට පසුව ඔබගේ සාමාන්‍ය ඉතුරුම් ශේෂවලින් 90% ක් දක්වා පොළී රහිත ණයක් ලබා ගැනීමේ හැකියාව • ණය පහසුකම සෑම වර්ෂයකම පැවතීම සහ සමාන මාසික වාරික 12 කින් ගෙවීමේ හැකියාව	අනුපාතිකය (AER) පිළිබඳව දැනගැනීම සඳහා කරුණාකර NDB බැංකු වෙබ් අඩවිය වෙත පිවිසෙන්න	කොන්දේසි සහ විෂ්මිත හානිපූරණ ආකෘතිය	දෙකෙන් අඩු අගය උපරිම ණය මුදල වේ • ණය මුදල සම්පූර්ණයෙන්ම ගෙවා නිම කරන තෙක් ප්‍රතිපූර්ණය කරන ලද ණය මුදලට සමානව විෂ්මිත ඉතිරි කිරීමේ ගිණුමේ හිලව් කිරීමක් තබනු ලැබේ

ඔබගේ පසුවිපරම අපසමග හුවමාරු කරගන්න

සියලු අවස්ථාවලදී ඔබ සෑහීමට පත්වන ආකාරයට ඔබවෙත අපගේ සේවා සැපයීම සඳහා අප ඇපකැපවී සිටින්නෙමු.

අප විසින් ඔබගේ අපේක්ෂාවන් කොතරම් හොඳින් ඉටුකර ඇද්ද යන්න පිළිබඳව දැනගැනීම සඳහා සහ අවශ්‍ය අවස්ථාවලදී දියුණු කරගතයුතු කරුණු පිළිබඳව දැනුවත්වීම සඳහා ඔබගේ පසුවිපරම අප හට උපකාරීවනු ඇත.

ඔබගේ පසුවිපරම හුවමාරු කරගත යුතු ආකාරය:

ඔබට ඔබගේ ශාඛා කළමනාකරු (ශාඛා සම්බන්ධතා විස්තර) හෝ ඔබගේ සම්බන්ධතා කළමනාකරු හා සම්බන්ධ විය හැකි ය.

අංක. +94 11 2448888/ +94 11 7448888 දරන පැය 24 පුරා ක්‍රියාත්මකවන ඇමතුම් මධ්‍යස්ථාන අංකය අමතන්න.

අප වෙත විද්‍යුත් තැපෑලෙන් යොමු කරන්න:- contact@ndbbank.com

ලිඛිතව ඉදිරිපත් කරන්න:- ගනුදෙනුකාර සේවා නිලධාරී, නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී අංක. 92, බර්නාඩ් සොයිසා මාවත, කොළඹ 05

අප විසින් ප්‍රතිචාර දක්වන ආකාරය;

පැමිණිල්ල ලැබීමෙන් පසුව, අප විසින් එය බැංකුවේ පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාකිරීමේ පද්ධතියෙහි වාර්තාකර එම ගැටලුව වහාම විසඳීම සඳහා උත්සාහ කරන්නෙමු. අපට එසේ ක්‍රියාකිරීමට අපොහොසත් වන අවස්ථාවක දී, අප විසින් ඔබ වෙත වැඩකරන දින තුනක් ඇතුලත විසඳුමක් ලබා දෙන්නෙමු. පැමිණිල්ලේ ස්වභාවය අනුව මෙම කාලසීමාව තුලදී මෙම ගැටලුව විසඳීමට අපට නොහැකි වුවහොත්, අප විසින් ඔබවෙත ප්‍රතිචාර දක්වනු ලබන ඇස්තමේන්තුගත කාලය පිළිබඳව ඔබව දැනුවත් කරන්නෙමු.

ඔබගේ ගැටලුව සම්බන්ධයෙන් වූ අපගේ ප්‍රතිචාරය සමග ඔබ කිසිසේත් සෑහීමට පත් නොවන්නේ නම්, ඔබට ශ්‍රී ලංකාවේ මූල්‍ය ඔම්බුඩ්ස්මන් කාර්යාලය සමග සම්බන්ධවිය හැකි වේ.

ආනන්ද කුමාරදාස මහතා
මූල්‍ය ඔම්බුඩ්ස්මන්
මූල්‍ය ඔම්බුඩ්ස්මන් කාර්යාලය

143A, වජිර පාර,

කොළඹ 05

දුරකතන අංකය: +94 11 259 5624

දුරකතන ෆැක්ස් අංකය: +94 11 259 5625

ඊ මේල්: fosril@sltnet.lk

වෙබ් අඩවිය: www.financialombudsman.lk

ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව.

තැපැල් ලිපිනය : මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව

අංක. 30, ජනාධිපති මාවත, කොළඹ 01

විමසීම් සඳහා වන ක්ෂණික ඇමතුම් අංකය : 1935

දුරකතන අංකය : +94112477444

දුරකථන ෆැක්ස් අංකය: +94112477444

ඊ මේල් : fcrd@cbsl.lk